# 10 ශ්‍රේණිය

# නර්තනය

## සැවුලා වන්නම



අන්තර්ගතය - වී.ඒ.කේ.පී.සංජීවනී - බප/කැල/සාන්ත ෆ්‍රැන්සිස් ම.වි., කැලණිය
සැකසුම - ජී. ඒ. ඩී. තාරකා - මාර/මහින්ද රාජපක්ෂ විද්‍යාලය , මාතර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# සැවුලා වන්නම

- උඩරට සම්ප්‍රදයට අයත් **වන්නම් 18 කි**.
- ඒ අතුරින් සැවුලා වන්නම **මාත්‍රා 2 + 4 දෙතිතට** හෙවත් **සුළු මහ දෙතිතට** අයත්ය.
- "සැවුලා" යන නම ද්‍රවිඩ භාෂාවෙන් බිඳී ආවක් වන අතර සැවුලා යනු කුකුළා හඳුන්වන තවත් නමකි.
- ස්කන්ධ පුරාණය නැමැති සංසකෘතික ග්‍රන්ථයෙහි එන කතා පුවතක් සැවුලා වන්නමට පසුබිම් වී ඇති බව කියවේ.
- සැවුලා වන්නම එහි මාතෘකාවට අදාළව වීරත්වයට හා ප්‍රබෝධයට තුඩුදෙන ආකාරයේ මනාව ගැලපෙන තාල රූපයකින් යුක්තය.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# සැවුලා වන්නම් ගායනය



- තාලය : මාත්‍රා 2 + 4 දෙතිත
  සුළු මහ දෙතිත
- බෙර පදය : දොං දොං ජිං ජිං ගජිගත
- තානම : තම් තම්දන තානම්
  දන තම්දන තානම්
  තම් තම්දන තානත්
  තෙයි තම්ද......
  නා තම්ද නා නා




e තක්සලාව
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



- කවිය

සුරිඳුන් පෙර සිටන් බලයුත් සැවතිඳුන්
සහගොස් කල යුදෙන් අසුරන් ජය නොලදින්
බර අත් ගෙන කඟින් ඇන කොන්තව් වලින්
අසුරන් කල යුදෙන් ජයගෙන කඳ කුමරුන්

ගසමින් කඟපතින් දෙපලුව අසුරසෙන්
දැරූ පා අතළුවෙන් පළු දෙක ගෙන සැනෙකින්
එම වම් පළුවකින් එ උපන් සැනයකින්
සැවුලා නම එයින් ලොව පළ කල උපතින්




Copyright © e-thaksalawa.moe.gov.lk



- කස්තිරම : කුඳ ගජිගත ///

කුඳ තා //

කුඳ ගජිගත ///

කුඳ තා //

කුඳ ගජිත කුඳ තා //

කුඳ තා //

කුඳ ගජිගත ///

කුඳ තා




Copyright © e-thaksalawa.moe.gov.lk

- **සීරුමාරුව:** තකු තක තරිකිට කුන්දත්

  ගජ්ජිත් තකජිත් කුන්දත්

  තකු තක තරිකිට කුන්දත් දොං තා





- **අඩව්ව :** ජෙන් තත් තත් /// ජෙන්තා

  ජෙනු තත් තත් /// ජෙනුතා

  ජෙන් තත් තත් ජෙන්තා

  ජෙනු තත් තත් ජෙනුතා

  ජෙන්තා ජෙනුතා

  දොහොකඩ තා - දොහොකඩ ගත කුඳ
  දොහොකඩ තා


e තක්සලාව The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# සැවුලා වන්නම නර්තනය



- ගායනයට අනුව තාලානුකූල චලනයෙහි යෙදීම වන්නම් නර්තනයෙහි ස්වභාවයයි.
- වන්නම් ගායනයේදී සිදුවන අදහස් ප්‍රකාශ නොවී චලනයට අනුව වන්නම නටයි.




Copyright © e-thaksalawa.moe.gov.lk